තොරතුරු මාසිකය

# විමර්ශන

2026 මාර්තු - අප්‍රේල්
ජනතා විමුක්ති පෙරමුණේ
අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි.

ලෝකය වෙනස් කිරීමට වෙනස් වෙමු!

# 2025 වසරේ ආර්ථික ජයග්‍රහණ

**රටක සංවර්ධනය උදෙසා විවිධ නිර්වචන තිබුණද, පොදුවේ ඕනෑම රටකට මෙය සරලව කොටස් දෙකකට බෙදිය හැකිය. එය ආර්ථික සංවර්ධනය සහ සමාජ සංවර්ධනය යනුයි. රටක් සමාජවාදී වුවද, ධනවාදී වුවද එරටෙහි වෙසෙන ජනතාවට නිදහස් සහ පහසුකම් සහිත ජීවිතයක් ගත කිරීමට ඉඩකඩ සැලසීම එරට රජයෙහි වගකීමයි.**

ධනවාදී රටකදී මෙම අවස්ථාව බොහෝ විට සුළුතරයකට ලැබෙන අතර, සමාජවාදී රාජ්‍යයකදී මෙම අවස්ථාව බහුතර ජනතාවකට ලැබේ. වැටී සිටි අගාධයෙන් අප රටක් ලෙස ගොඩ එමින් සිටින අතර, වසරක් තුළ ලබා ගත් ආර්ථික සංවර්ධනය මෙම සමාජ සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය කරුණක් බවට පත්ව තිබේ. ආණ්ඩුවේ වසරක ආර්ථික සංවර්ධනය ප්‍රථම වරට ගණනය කරගත හැකි වන්නේ 2025 වසර තුළදීය. ඒ අනුව ආර්ථික වශයෙන් බංකොළොත්ව තිබුණු රටක් ආර්ථික ස්ථාවරභාවය අත්පත් කර ගැනීම ආරම්භ කළ වසර ලෙස 2025 වසර සනිටුහන් වේ. මේ සඳහා විවිධ ආර්ථික දත්ත කිහිපයක් භාවිත කළ හැකි අතර, ඒ ඇසුරෙන් රටෙහි ආර්ථික ස්ථාවරභාවය මැනගත හැකිය.

රටක ආර්ථික සංවර්ධනයේදී එය මැන බලන ප්‍රධාන නිර්ණායක අතර ආර්ථික වර්ධන වේගය ඉතා වැදගත් වේ. දළ දේශීය නිෂ්පාදනයේ (**GDP**) වර්ධනය මත ආර්ථික වර්ධනය තීරණය වන අතර, එය ආර්ථිකය හැසිරෙන ආකාරය අනුව අවබෝධ කරගත හැකිය. ආර්ථික වර්ධනයක් පවතින විට එය අනෙකුත් සාධක එනම් උද්ධමනය, විදේශ විනිමය අනුපාත, අපනයන, වෙළෙඳ ශේෂය, අයවැය පරතරය වැනි දත්ත හරහා පිළිබිඹු වේ. ඒ අනුව 2024 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය 5%ක් පමණවූ අතර, එය 2025 වසරේදී 5.6%ක් බවට ඇස්තමේන්තු කර තිබේ. පසුගිය වසර ගණනාවක මෙම මට්ටමට ළඟාවීමට නොහැකිව ආර්ථිකය එකතැන පල්වූ අතර, සමහර වසරවල ඍණ ආර්ථික වර්ධනයන්ද දක්නට ලැබිණි. ආර්ථික වර්ධනය 2020 වසරේ - 4.6%ක් වූ අතර, 2022 වසරේ එය -7.3%ක් විය. ඒ අනුව මෙම වර්ධනය අඛණ්ඩව නඩත්තු කිරීම රට ආර්ථික වශයෙන් සංවර්ධනය කිරීමට අත්‍යවශ්‍ය කරුණකි.

රටක ආර්ථික වර්ධනයට සාපේක්ෂව එරටෙහි අපනයන ආදායම ඉහළ යා යුතුය. ලෝකයේ ඕනෑම රටක ආර්ථික වර්ධනයක් ඇති අවස්ථාවක එරටෙහි අපනයන ආදායම ඉහළ යනු ඇත. අපනයන ආදායම සහ ආර්ථික වර්ධනය අතර ඇත්තේ ධන සම්බන්ධතාවකි. ඒ අනුව පසුගිය වසර දෙකෙහි විදේශ වෙළෙඳමෙහි හැසිරීම පහත පරිදි වේ: (වගු අංක 01)

| විස්තරය | 2024 | 2025 |
|---|---|---|
| අපනයන ආදායම - ඩො.මි. | 16,380 | 17,250 |
| අපනයන | 18,390 | 19,600 |
| වෙළෙඳ පරතරය | 2,010 | 2,350 |
| (වගු අංක 01) | | |

ඉහත සංඛ්‍යා ලේඛනයට අනුව 2024 වර්ෂයට සාපේක්ෂව 2025 වර්ෂයේ වෙළෙඳ ගිණුමේ ශේෂයෙහි විශාල වෙනස්කමක් හෝ අර්බුදයක් හෝ දක්නට ලැබුණේ නැත. එහෙත්, විපක්ෂයේ බොහෝ අය විශ්වාස කළේ ගෙවුම් ශේෂ අර්බුදයක් ඇති විය හැකි බවයි. එයට හේතුව වසර පහක් පමණ නවතා දමා තිබූ වාහන ආනයනය නැවත ඇරඹීමයි. පසුගිය වසරේ වාහන ආනයනය සඳහා රජය ඩොලර් මිලියන 1,900කට ආසන්න මුදලක් වියදම් කළ අතර, එය ආර්ථිකය තිබූ මට්ටම සමඟ සලකා බලන කල විශාල මුදලකි. එහෙත්, ආර්ථිකයට මෙය දරාගත හැකි දෙයක් බවට පත්වන්නේ විදේශ විනිමය කළමනාකරණය ඉහළ මට්ටමක පැවතීමෙනි. අපනයන ආදායම වැඩිවීම මෙන්ම විදෙස් ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ ප්‍රමාණය ඉහළ යාමත්, සංචාරක ව්‍යාපාරයේ ඇතිවූ සැලැකිය යුතු වර්ධනයත් මේ සඳහා ඉතා විශාල ලෙස බලපෑවේය. (වගු අංක 02)

| සංචාරකයන්ගේ පැමිණීම සහ ආදායම | | |
|---|---|---|
| වර්ෂය | පැමිණි සංචාරක ප්‍රමාණය | ආදායම - ඩො.මි. |
| 2023 | 14,87,303 | 2,070 |
| 2024 | 20,53,465 | 3,170 |
| 2025 | 23,62,521 | 3,220 |
| (වගු අංක 02) | | |

2023 සහ 2024 වසරවලට සාපේක්ෂව 2025 වසරේ ලංකාවේ සංචාරක ව්‍යාපාරයේ සැලැකිය යුතු වර්ධනයක් දක්නට ලැබිණි. එයට ප්‍රධාන හේතුව වන්නේ රට තුළ ඇති සාමකාමී, නිදහස් වාතාවරණයත්, ආර්ථිකයේ සහ රට තුළ ඇතිවී ඇති නව පිබිදීමත්ය. වසර දෙකක් තුළ සංචාරක ව්‍යාපාරයෙන් ලැබෙන ආදායම ඩොලර් මිලියන 1,200කින් ඉහළ දමා ගැනීමට හැකිවීම ආර්ථික අතින් ඉතා වාසිදායක තත්ත්වයකි.

අනෙක් අතට ආර්ථික ස්ථාවරභාවයට අවශ්‍ය කරනු ලබන විදේශ විනිමය උපයා ගැනීමට වැඩිම දායකත්වය සපයන විදේශ ශ්‍රමික ප්‍රේෂණ ප්‍රමාණයද 2025 වසරේ විශාල ලෙස ඉහළ ගොස් තිබිණි. (වගු අංක 03)

විදේශ ශ්‍රමිකයන් විසින් රට තුළට මුදල් එවනු ලබන්නේ ප්‍රධාන අවශ්‍යතා දෙකක් වෙනුවෙනි. ඒ පරිභෝජනය සහ ආයෝජනය වෙනුවෙනි. මෙහිදී රට තුළ භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට පෙළැඹීමත්, ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීමත් සිදුවන්නේ ආර්ථිකයේ පවතින ස්ථාවරභාවය මතය. ඉහළ උද්ධමන අනුපාතයත්, මූල්‍ය වෙළෙඳපොළේ අස්ථාවරභාවයත් විදේශ ශ්‍රමික ප්‍රේෂණ රට තුළට ගලා ඒම අඩාළ කරන අතර, මූල්‍ය වෙළෙඳපොළේ ඇති වන ස්ථාවරභාවය විසින් රට තුළට විදේශ ප්‍රේෂණ එවනු ලැබීම ඉහළ යා හැකිය.

| වර්ෂය | 2022 | 2023 | 2024 | 2025 |
|---|---|---|---|---|
| ප්‍රේෂණ ප්‍රමාණය (එ.ජ.ඩො.මි) | 3,789 | 5,970 | 6,570 | 8,070 |
| (වගු අංක 03) | | | | |

මීට සාපේක්ෂව රාජ්‍ය මූල්‍ය කළමනාකරණයද පසුගිය වසරවලට සාපේක්ෂව ඉතා ඉහළ මට්ටමක පැවැතිණි. එය රාජ්‍ය අයවැයෙහි ඇතිවූ ප්‍රගතිය මඟින් මනාව පැහැදිලි වේ. (වගු අංක 04)

විශාල ආර්ථික අර්බුදයකින් පසුවත් පිළියෙළ කරනු ලබන අයවැය ආර්ථිකයට වාසි වන අයුරින් කළමනාකරණය කර ගැනීමට හැකිවීම ආර්ථික වර්ධනයක ප්‍රධාන ලක්ෂණයකි. අයවැය මඟින් ආර්ථිකයට ඇති කරනු ලබන පීඩනය 2025 වසරේ අයවැයෙහි දක්නට නොලැබුණු අතර, පසුගිය කාලයේ දිගින් දිගටම සිදුවූ අයවැය හිඟය පියවීම සඳහා දේශීය සහ විදේශීය මූලාශ්‍රවලින් ණය ලබා ගැනීම ඉතා අවම මට්ටමක පැවැතිණි.

07 කලාපය

# රජයේ තනතුරු සඳහා පත් කිරීම හා ඉවත් කිරීම
# නෛතික හා පරිපාලනමය ක්‍රියාවලිය පිළිබඳ විමසීමක්

**රජයේ ප්‍රධාන තනතුරු සඳහා පත්කිරීම්වලටත් ඉවත් කිරීම්වලටත් අදාළ නෛතික සහ පරිපාලනමය ක්‍රියාවලිය විමසා බැලීමට මෙම ලිපිය මගින් අපේක්ෂා කරමු. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව, ආයතන සංග්‍රහය සහ කාර්ය පටිපාටික රීති මේ සඳහා මූලාශ්‍ර කර ගෙන ඇත.**

### ජනාධිපති බලතල අනුව කරනු ලබන පත්වීම්

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (21 වැනි සංශෝධනය දක්වා) විධිවිධානවලට අනුව රජයේ ප්‍රධාන තනතුරු සඳහා පත් කිරීම් සහ ඉවත් කිරීම් සිදු කරන ආකාරය පහත පරිදි වේ :

### 1. අමාත්‍යාංශ ලේකම්වරු
### Secretaries to Ministries

• පත් කිරීම: ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබේ. (ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාව)

• ඉවත් කිරීම: ජනාධිපතිවරයා සතු අභිමතය පරිදි තනතුරෙන් ඉවත් කළ හැකි ය. ලේකම්වරයා සිය ධුරයෙන් ඉල්ලා අස් වූ අවස්ථාවක ලේකම්වරයාගේ ධුර කාලය අවසන් වේ.

### 2. ජනාධිපති ලේකම්
### Secretary to the President

• පත් කිරීම: ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබේ.

• ඉවත් කිරීම: ජනාධිපතිවරයාගේ අභිමතය පරිදි සේවයෙන් ඉවත් කළ හැකි ය.

### 3. නීතිපති
### Attorney-General

• පත් කිරීම: ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ඇ) හි දක්වා ඇති පරිදි ජනාධිපතිවරයා විසින් කරනු ලබන නිර්දේශයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් අනුමත කිරීමෙන් පසුව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබේ.

• ඉවත් කිරීම: නීතිපතිවරයා ධුරයෙන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයකු ඉවත් කිරීමේ ක්‍රියාවලියට සමාන වේ. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වැනි ව්‍යවස්ථාව මඟින් දක්වා ඇති මෙම ක්‍රියාපටිපාටිය පහත පරිදි වේ:

**i. ඉවත් කළ හැකි පදනම් (Grounds for Removal)** - නීතිපතිවරයා හෝ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයකු හෝ ධුරයෙන් ඉවත් කළ හැක්කේ කරුණු දෙකක් මත පදනම්වය.

• ඔප්පු වූ අනිසි චර්යාව / විෂම පැවැත්ම (**Proved Misbehaviour**) - තනතුරේ ගෞරවයට හානි වන අයුරින් කටයුතු කිරීම හෝ නීති විරෝධී ක්‍රියාවල නිරත වීම

• අශක්නුතාව /අබලතාව (**Incapacity**) - කායික හෝ මානසික දුබලතාවක් හේතුවෙන් සිය ධුරයේ රාජකාරි ඉටු කිරීමට නොහැකි වීම

**ii. පාර්ලිමේන්තු යෝජනාව ඉදිරිපත් කිරීම (The Resolution):**

• නීතිපතිවරයා ධුරයෙන් ඉවත් කිරීම සඳහා වන යෝජනාවක් පාර්ලිමේන්තුවේ සමස්ත මන්ත්‍රී සංඛ්‍යාවෙන් අවම වශයෙන් තුනෙන් එක (1/3)ක අත්සනින් යුතුව කථානායකවරයා වෙත භාර දිය යුතු ය.

• මෙම යෝජනාවේ අදාළ පුද්ගලයාට එරෙහි චෝදනා විස්තරාත්මකව ඇතුළත් විය යුතුය.

**iii. විමර්ශන කමිටුවක් පත් කිරීම (Investigation)**

• යෝජනාව කථානායකවරයා විසින් පිළිගනු ලැබූ පසු, එම චෝදනා පිළිබඳව විමර්ශනය කර වාර්තා කිරීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කමිටුවක් පත් කරනු ලැබේ.

• මෙම කමිටුව මඟින් අදාළ නිලධාරියාට තමන්ට එරෙහි චෝදනාවලට පිළිතුරු දීමට සහ නීතිඥ සහාය ලබා ගැනීමට සාධාරණ අවස්ථාවක් ලබා දිය යුතු ය.

**iv. පාර්ලිමේන්තුවේ අනුමැතිය (Approval by Parliament)**

• විමර්ශන කමිටුව මඟින් චෝදනා සත්‍යය බව තහවුරු වුවහොත්, එම වාර්තාව පාර්ලිමේන්තුවේ විවාදයට ගනු ලැබේ.

• අනතුරුව, ඔහුව ඉවත් කිරීම සඳහා වන යෝජනාව (**Address to the President**) පාර්ලිමේන්තුවේ සමස්ත මන්ත්‍රී සංඛ්‍යාවෙන් බහුතරයකින් (එනම් මන්ත්‍රීවරුන් 113කට නොඅඩු සංඛ්‍යාවකින්) සම්මත විය යුතුය.

**v. ජනාධිපතිවරයා විසින් ඉවත් කිරීම (Order of Removal)**

• පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද එම යෝජනාව ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලබන අතර, ඉන්පසුව ජනාධිපතිවරයා විසින් නිකුත් කරනු ලබන නියෝගයක් මඟින් නීතිපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබේ.

### 4. විගණකාධිපති
### Auditor-General)

• පත් කිරීම: ජනාධිපතිවරයාගේ නිර්දේශය මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය ඇතිව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබේ.

විගණකාධිපතිවරයා (**Auditor-General**) යනු රජයේ වියදම් සහ මූල්‍ය පාලනය පිළිබඳව පාර්ලිමේන්තුවට වග කියන ස්වාධීන නිලධාරියා වේ. ඔහුගේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා, ඔහුව ධුරයෙන් ඉවත් කිරීම ඉතා දුෂ්කර හා විධිමත් පටිපාටියකට යටත් කර ඇත.

• ඉවත් කිරීම: ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව, විගණකාධිපතිවරයා ඉවත් කිරීමේ විස්තරාත්මක පටිපාටිය පහත පරිදි වේ:

**i. ඉවත් කළ හැකි පදනම්:**

විගණකාධිපතිවරයකු සාමාන්‍යයෙන් වයස අවුරුදු 60 සම්පූර්ණ වන තෙක් ධුරය දරයි. එහෙත්, ඊට පෙර ඔහුව ඉවත් කළ හැක්කේ පහත කරුණු දෙකෙන් එකක් ඔප්පු වුවහොත් පමණි:

• ඔප්පු වූ අනිසි චර්යාව - සිය තනතුරට නොගැළපෙන අයුරින් දූෂිත හෝ නීති විරෝධී හෝ ක්‍රියාවක නිරත වීම.

• අශක්නුතාව - මානසික හෝ කායික හෝ දුබලතාවයක් හේතුවෙන් තම රාජකාරි ඉටු කිරීමට නොහැකි වීම.

**ii. පාර්ලිමේන්තු යෝජනාව**

විගණකාධිපතිවරයා ඉවත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ වන්නේ පාර්ලිමේන්තුවෙනි.

• ඔහුව ඉවත් කළ යුතු බවට වන යෝජනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

• මෙම යෝජනාව පාර්ලිමේන්තුවේ බහුතර මන්ත්‍රී සංඛ්‍යාවකගේ අනුමැතියෙන් සම්මත විය යුතුය.

**iii. විමර්ශන ක්‍රියාවලිය:**

යෝජනාවක් ඉදිරිපත් වූ පමණින් නිලධාරියකු ඉවත් කළ නොහැකි ය.

• එල්ල වී ඇති චෝදනා විමර්ශනය කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් විශේෂ කමිටුවක් හෝ විමර්ශන මණ්ඩලයක් පත් කරනු ලැබේ.

• මෙහිදී විගණකාධිපතිවරයාට තමන්ට එරෙහි චෝදනාවලට පිළිතුරු දීමටත්, ස්වකීය නිර්දෝෂීභාවය ඔප්පු කිරීමටත් සාධාරණ අවස්ථාවක් (**Right to be heard**) ලබා දිය යුතුය.

**iv. ජනාධිපතිවරයා වෙත යොමු කිරීම (Address to the President)**

• විමර්ශනයෙන් පසුව චෝදනා ඔප්පු වී ඇත්නම්, පාර්ලිමේන්තුව විසින් එම ඉවත් කිරීමේ යෝජනාව සම්මත කර ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබේ.

• මෙම යෝජනාව පාර්ලිමේන්තුවේ 'සමස්ත මන්ත්‍රී සංඛ්‍යාවෙන් බහුතරයකින්' (මන්ත්‍රීවරුන් 113 කට නොඅඩු) සම්මත වීම අනිවාර්යය වේ.

**v. ජනාධිපතිවරයා විසින් ඉවත් කිරීම**

• පාර්ලිමේන්තුව විසින් එවැනි යෝජනාවක් ඉදිරිපත් කළ විට, ජනාධිපතිවරයා විසින් විගණකාධිපතිවරයා ධුරයෙන් ඉවත් කිරීමේ නියෝගය නිකුත් කරනු ලැබේ.

### 5. පොලිස්පති
### Inspector General of Police)

• පත් කිරීම: ජනාධිපතිවරයාගේ නිර්දේශය මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය ඇතිව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබේ.

පොලිස්පතිවරයා (**IGP**) යනු මෙරට නීතිය හා සාමය ආරක්ෂා කරන ප්‍රධානතම නිලධාරියා වන බැවින්, ඔහුගේ ධුරයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා 1981 අංක 5 දරන රජයේ නිලධාරීන් (ඉවත් කිරීමේ) පනත මඟින් ඉතා විශේෂිත සහ දැඩි ක්‍රියා පටිපාටියක් පනවා ඇත. මෙම පටිපාටිය පියවරෙන් පියවර පහත පරිදිය.

**i. ඉවත් කළ හැකි පදනම්:**

පොලිස්පතිවරයා ධුරයෙන් ඉවත් කළ හැක්කේ පහත සඳහන් කරුණු ඔප්පු වුවහොත් පමණි.

• අනිසි චර්යාව: රාජකාරි පැහැර හැරීම, දූෂණය හෝ සදාචාර විරෝධී ක්‍රියාවල හෝ නිරත වීම.

• අශක්නුතාව: ශාරීරික හෝ මානසික හෝ දුබලතාවක් හේතුවෙන් තම රාජකාරි ඉටු කිරීමට නොහැකි වීම.

**ii. පාර්ලිමේන්තු යෝජනාව ඉදිරිපත් කිරීම.**

• පොලිස්පතිවරයා ඉවත් කිරීම සඳහා වන යෝජනාව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් අවම වශයෙන් තුනෙන් එක (1/3)ක අත්සනින් යුතුව කථානායකවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

• එම යෝජනාවේ පොලිස්පතිවරයාට එරෙහි චෝදනා පැහැදිලිව සඳහන් විය යුතුය.

**iii. විමර්ශන කමිටුවක් පත් කිරීම:**

• කථානායකවරයා විසින් මෙම චෝදනා විමර්ශනය කිරීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කමිටුවක් හෝ පනතේ දැක්වෙන පරිදි විනිශ්චය සභාවක් පත් කරනු ලැබේ.

• විත්තියේ අයිතිය: මෙම විමර්ශන කාලය තුළ පොලිස්පතිවරයාට තමන්ට එරෙහි චෝදනාවලට පිළිතුරු දීමටත්, සාක්ෂිකරුවන් කැඳවීමටත්, නීතිඥ සහාය ලබා ගැනීමටත් පූර්ණ අයිතිය ඇත.

**iv. වාර්තාව ඉදිරිපත් කිරීම සහ විවාදය**

• විමර්ශනය අවසානයේ එම කමිටුව විසින් සිය වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබයි.

• චෝදනා ඔප්පු වී ඇති බව වාර්තාව මඟින් තහවුරු කරනු ලැබුවහොත් පමණක් එම යෝජනාව පාර්ලිමේන්තුවේ විවාදයට ගනු ලැබේ.

**v. පාර්ලිමේන්තුවේ අනුමැතිය:**

• පොලිස්පතිවරයා ඉවත් කිරීමේ යෝජනාව පාර්ලිමේන්තුවේ සමස්ත මන්ත්‍රී සංඛ්‍යාවෙන් බහුතරයකින් (මන්ත්‍රීවරුන් 113කට වැඩි) සම්මත විය යුතුය.

**vi. ජනාධිපතිවරයාගේ නියෝගය:**

• පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද එම යෝජනාව ජනාධිපතිවරයා වෙත යොමු කරන අතර, ජනාධිපතිවරයා විසින් පොලිස්පතිවරයා ධුරයෙන් ඉවත් කිරීමේ නිල නියෝගය නිකුත් කරනු ලැබේ.

### 6. අමාත්‍ය මණ්ඩල ලේකම්
### Secretary to the Cabinet

• පත් කිරීම - ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබේ.

• ඉවත් කිරීම - ජනාධිපතිවරයාගේ අභිමතය පරිදි ධුරයෙන් ඉවත් කළ හැකිය.

### 7. අග්‍රාමාත්‍ය ලේකම්
### Secretary to the Prime Minister

• පත් කිරීම - ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබේ.

• ඉවත් කිරීම - ජනාධිපතිවරයාගේ අභිමතය පරිදි ධුරයෙන් ඉවත් කළ හැකි ය.

### 8. අධිකරණ සේවා නිලධාරීන් බඳවා ගැනීම සහ ඉවත් කිරීම

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අධිකරණ සේවා නිලධාරීන් බඳවා ගැනීම සහ ඉවත් කිරීම ඉතා සුවිශේෂී පටිපාටියකට යටත් වේ. මෙය ප්‍රධාන ස්ථර දෙකක් යටතේ විස්තර කළ හැකි ය.

**ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ විනිසුරුවරුන්:**

මෙම තනතුරු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ආරක්ෂා කර ඇති ඉහළම අධිකරණ තනතුරු වේ.

• පත් කිරීම - ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන අතර, එම පත්වීම් සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතිය ලබා ගැනීම අනිවාර්යය වේ. (107 වැනි ව්‍යවස්ථාව). තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 ඇ (4) අනුව, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් සහ අභියාචනාධිකරණ සභාපතිවරයා හා අභියාචනාධිකරණ විනිශ්චයකාරවරුන් පත් කිරීම හා සම්බන්ධ ස්වකීය කාර්යය ඉටුකිරීමේදී ව්‍යවස්ථාදායක සභාව විසින් අග්‍රවිනිශ්චයකාරවරයාගේ අදහස් ලබා ගැනීම සිදු කෙරේ.

• ඉවත් කිරීම (දෝෂාභියෝග ක්‍රියාවලිය) - මෙම විනිසුරුවරුන් ඉවත් කළ හැක්කේ "ඔප්පු වූ අනිසි චර්යාව/ විෂම පැවැත්ම හෝ අශක්නුතාව/ දුබලතාව" යන පදනම මත පමණි.

• පියවර 1: පාර්ලිමේන්තුවේ සමස්ත මන්ත්‍රී සංඛ්‍යාවෙන් අවම වශයෙන් 1/3ක අත්සනින් යුතු යෝජනාවක් කථානායකවරයා වෙත ඉදිරිපත් කිරීම.

• පියවර 2: චෝදනා විමර්ශනය සඳහා පාර්ලිමේන්තු තේරීම් කමිටුවක් පත් කිරීම

• පියවර 3: චෝදනා ඔප්පු වුවහොත්, එම ඉවත් කිරීමේ යෝජනාව පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රීවරුන් සංඛ්‍යාවෙන් බහුතර සංඛ්‍යාවක් විසින් සම්මත කළ යුතුය.

• පියවර 4: පාර්ලිමේන්තු අනුමැතියෙන් පසු ජනාධිපතිවරයා විසින් නිල වශයෙන් ධුරයෙන් ඉවත් කිරීමේ නියෝගය නිකුත් කරනු ලැබේ.

### 9. මහාධිකරණ විනිසුරුවරුන්:

• පත් කිරීම: අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබේ (111 වැනි ව්‍යවස්ථාව).

• ඉවත් කිරීම: ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 (2) ආ අනුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, ජනාධිපතිවරයාගේ විනය පාලනයට ඔවුහු යටත් වෙති.

අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන බඳවා ගැනීම්:

පහළ උසාවිවල විනිසුරුවරුන් (දිසා විනිසුරුවරුන් සහ මහේස්ත්‍රාත්වරුන්)

i මොවුන් 'අධිකරණ නිලධරයන්' ලෙස හැඳින්වේ (111 ඈ ව්‍යවස්ථාව).

• පත් කිරීම: මෙම පත්වීම් සිදු කිරීමේ පූර්ණ බලය අධිකරණ සේවා කොමිෂන් සභාව (**JSC**) සතු වේ. සාමාන්‍යයෙන් විවෘත තරග විභාග සහ සම්මුඛ පරීක්ෂණ මඟින් සුදුසුකම් ලත් නීතිඥවරුන් මෙම තනතුරු සඳහා බඳවා ගනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 ඌ (1) (ආ) අනුව.

• විනය පාලනය: මොවුන් ඉවත් කිරීමේ, විනය පාලනය කිරීමේ සහ මාරු කිරීමේ බලයද අධිකරණ සේවා කොමිෂන් සභාව සතු ය.

• පරීක්ෂණය: යම් චෝදනාවක් එල්ල වූ විට, කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන විමර්ශන නිලධාරියකු මඟින් මූලික පරීක්ෂණයක් පැවැත්වේ.

• තීරණය: විධිමත් විනය පරීක්ෂණයකින් පසුව වරදකරු වුවහොත්, ඔවුන් ධුරයෙන් ඉවත් කිරීමට හෝ සේවයෙන් පහ කිරීමට කොමිෂන් සභාවට හැකියාව ඇත.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ සංයුතිය:

මෙම කොමිෂන් සභාව සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත වේ (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 ඇ (1)).

1. අගවිනිසුරුවරයා (සභාපති ලෙස).
2. ශ්‍රේෂ්ඨාධිකරණයේ අනෙකුත් ජ්‍යෙෂ්ඨතම විනිසුරුවරුන් දෙදෙනෙකු.

වැදගත්: අධිකරණ නිලධරයකුගේ කටයුතුවලට අයුතු ලෙස බලපෑම් කිරීමට උත්සාහ කරන ඕනෑම අයකු වසර තුනක කාලයක් බන්ධනාගාරගත කිරීම හෝ රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයක් හෝ මේ දෙකම හෝ යන දඬුවම් ලැබිය හැකි බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 ඌ ව්‍යවස්ථාව යටතේ දක්වා ඇත. මෙය අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා වූ ප්‍රධාන විධිවිධානයකි.


**රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන බඳවා ගැනීම් පිළිබඳව ලබන කලාපයෙන් බලාපොරොත්තු වන්න.**

# වානරයාගේ සිට මිනිසා දක්වා... 03 කොටස

### ආඩිපිතකස්
**Ardipithecus**


මයෝසීන අවධියේ අවසානයත්, ප්ලීයෝසීන අවධියේ ආරම්භයත් අතර කාලයේ මිහිමත වාසය කළ මානව ලක්ෂණ සහිත වානර කුලයක් ලෙස ආඩිපිතකස් විශේෂ හැඳින්විය හැකිය. මානව පරිණාමයේදී චිම්පන්සියාගෙන් වෙන්වීමෙන් පසු මුල් අවධියේ බිහිවූ විශේෂ අතුරින් දැනට අප දන්නා විශේෂ 2ක් මෙම කුලයට අයත් වේ. ඉන් එකක් ආඩිපිතකස් කඩබ්බා වන අතර අනෙක ආඩිපිතකස් රැමිඩස්ය. අදින් වසර මිලියන 5.8ත් 4.4ත් අතර කාලය තුළ ආඩිපිතකස් විශේෂ මිහිමත වෙසෙන්නට ඇතැයි විශ්වාස කෙරේ.

නැගෙනහිර අප්‍රිකාවේ ඉතියෝපියානු භූමිවල වාසය කළ මොවුන් ගස් මත වාසය කිරීම මෙන්ම ගසින් බැස ඇවිද යාම ද



ආඩිපිතකස් රැමිඩස් ගේ හිස් කබලක්

සිදුකරන්නට ඇතැයි විශ්වාස කෙරේ. මෙය පදනම් කරගනිමින් ඉතියෝපියාවේ අෆාර් භාෂාවෙන් 'මිහිමත' යන අරුත් දෙන 'ආඩි' යන වචනය සහ ග්‍රීක් භාෂාවෙන් වානරයා හඳුන්වන 'පිතකස්' යන්න එක්කර ආඩිපිතකස් යන නම තබා ඇත. අවසාන කාලයට අයත් ආඩිපිතකස් පොසිල ඔස්ත්‍රෙලෝපිතකස් ලක්ෂණ වැඩි වශයෙන් පෙන්වන බැවින්, ඔස්ත්‍රෙලෝපිතකස් පරිණාමය වූයේ ආඩිපිතකස් හරහා බවට විශ්වාසයක් පවතී. එය නිවැරදි නම්, ආඩිපිතකස්, වත්මන් හෝමෝ සේපියන් මානවයාගේ මුතුන්මිත්තකු වීමට වැඩි




ආඩිපිතකස් කඩබ්බා සහ ආඩිපිතකස් රැමිඩස් ගේ පොසිල හමුවී ඇති ප්‍රදේශ.


ඉඩකඩක් පවතී. එම නිසා මානව පරිණාමය ඇඳිය හැකි ගසෙහි මානව කොටසට අයත් මුල් ශාඛාවක් ලෙස ආඩිපිතකස් ස්ථානගතව ඇත.

සමහර විද්‍යාඥයන් පවසන්නේ සහෙලැන්ත්‍රොපස්, ඔරෝරින් සහ ආඩිපිතකස් යන සියල්ල එකම කුලයකට අයත් විය හැකි බවත්, ඒවා එම පොදු කුලයට අයත් වෙන් වෙන් විශේෂ විය හැකි බවත්ය. කෙසේ නමුත්, ඒ සියලු තර්ක තුළ මෙම විශේෂ වෙන් වෙන්ව පැවැති බවට වන පොදු පිළිගැනීම අහෝසි නොවේ.

### ආඩිපිතකස් කඩබ්බා
**Ardipithecus Kadabba**

අදින් වසර මිලියන 5.8ත් 5.2ත් අතර කාලයේ එනම්, මයෝසීන අවධියේ අවසන් කාලයේ ආඩිපිතකස් කඩබ්බා මිහිමත විසූ බවට මේ වන විට සාක්ෂි ලැබී ඇත. 1997 - 2000 කාලයේ සොයා ගත් පොසිල කිහිපයක් පදනම් කරගනිමින් ඉතියෝපියානු ජාතික විද්‍යාඥයකු වන යොහැන්නස් හේලි සිලාසි විසින් 2001 වසරේදී ප්‍රථම වරට මෙම විශේෂය පිළිබඳව අදහස් පළ කරන ලදී. 2002දී හමුවූ තවත් පොසිල පදනම් කරගනිමින් 2004දී ඔහු ජපන් ජාතික විද්‍යාඥ ජෙන් සූවා සහ ඇමෙරිකානු ජාතික විද්‍යාඥ ටිම් වයිට් සමඟ කළ පර්යේෂණවලින් පසුව ආඩිපිතකස් කඩබ්බා යනු වැඩි වශයෙන් වානරයන්ට සමාන ලක්ෂණ පෙන්නුම් කරන නව විශේෂයක් ලෙස හැඳින්වීය.

ඉතියෝපියාවේ මධ්‍යම අවාශ් ප්‍රදේශයට අයත් ස්ථාන 5කින් මෙම විශේෂයට අයත් පොසිල කොටස් සොයාගෙන තිබේ. එරට




දැනට හමුවී ඇති අඩිපිතකස් කඩබ්බාට අයත් අස්ථි කොටස්




ආඩිපිතකස් විශේෂයට අයත් වක්‍ර වූ ඇඟිලි අස්ථි

ප්‍රාදේශීය භාෂාවක් වූ 'අෆාර්' භාෂාවෙන් 'මුතුන්මිත්තන්ගේ පදනම' යන අරුත් සහිතව 'කඩබ්බා' ලෙස නම් තබා ඇත. මොවුන් බොහෝ විට පලතුරු, ඇට වර්ග සහ ශාක පත්‍ර අනුභව කරන්නට ඇතැයි විශ්වාස කෙරේ. වත්මන් චිම්පන්සීන්ට සාපේක්ෂව ඉදිරි දත් පටුවීමත්, පසුපස දත් විශාල වීමත් අනුව ඔවුන් වඩා රළු ආහාර පසුපස දත්වලින් හපා අනුභව කරන්නට ඇතැයි යන නිගමනයට එළැඹ තිබේ.

මෙතෙක් සොයාගෙන ඇති පොසිල කොටස් සීමිත වීම නිසා ආඩිපිතකස් කඩබ්බාගේ ශරීර විශාලත්වය හෝ ස්වභාවය පිළිබඳව වැඩි විස්තර මෙතෙක් නිවැරදිව කිව නොහැකිව තිබේ. එහෙත්, ඔවුන්ගේ මොළයේ ප්‍රමාණය සහ විශාලත්වය මෙන්ම ශරීර ස්වභාවය වත්මන් චිම්පන්සීන්ට බොහෝ දුරට සමාන වන්නට ඇතැයි විශ්වාස කෙරේ. හමුව ඇති පාද අස්ථි අනුව දෙපයින් ගමන් කිරීමේ හැකියාව මෙම විශේෂය සතුව පැවැති බව උපකල්පනය කෙරේ. දත්වල ඝන එනැමලයක් තිබීමත්, විශාල රදනක දත් තිබීමත් බොහෝ දුරට නූතන මානවයාට වඩා පැරණි වනර විශේෂවල ලක්ෂණ පෙන්නුම් කරන්නකි.

ආඩිපිතකස් කඩබ්බා අතට හසුවන ගල් කැබැලි සහ ලී දඬු ආයුධ ලෙස භාවිත කරන්නට ඇතැයි සැලැකිය හැකිය. ඇට වර්ග තළා ගැනීම වැනි දේ සඳහා ඒවා භාවිත කිරීම හැරුණුකොට වෙනත් විශේෂ



අඩිපිතකස් රැමිඩස්ගේ අස්ථි පද්ධතිය සහ ඒ ඇසුරින් නිර්මිත රුවක්

ආයුධ භාවිතාවක් සඳහා ඔවුනට හැකියාව තිබී නැත. වනාන්තර, තෘණ බිම් සහ ජලාශ යන සියල්ල සහිත භූමි ප්‍රදේශවල වාසය කර ඇති නිසා ඔවුහු ගස් මත මෙන්ම ගසින් බැස පොළොව මත ද ජීවත් වන්නට ඇත.

දැනට පවතින සාක්ෂි අනුව විද්‍යාඥයන් විශ්වාස කරන්නේ ආඩිපිතකස් කඩබ්බා යනු පරිණාමය තුළ වෙන්වී සිය ගමන අවසන් කළ ශාඛාවක් නොවන බවයි. ඔවුන් අභාවයට ගියේ ආඩිපිතකස් රැමිඩස් ලෙස නව විශේෂයක් බවට පරිණාමය වෙමින් බව පොදු පිළිගැනීමයි. ආඩිපිතකස් කඩබ්බා මිහිමත වසන සමයේ ඔවුන් හා සමකාලීනව ඔරෝරින්ද මිහිමත වාසය කර ඇත.

### ආඩිපිතකස් රැමිඩස්
**Ardipithecus Ramidus**

ආඩිපිතකස් කුලයේ දැනට අප දන්නා ප්‍රථමයා ආඩිපිතකස් කඩබ්බා වුවද, මිනිසා විසින් ප්‍රථමයෙන් සොයා ගත් විශේෂය ආඩිපිතකස් රැමිඩස්ය. 1994දී ජපන් ජාතික විද්‍යාඥ ජෙන් සූවා, ඇමෙරිකානු ජාතික විද්‍යාඥ ටිම් වයිට් සහ ඉතියෝපියානු ජාතික විද්‍යාඥ බර්හේන් අස්ෆාව් විසින් ප්‍රථම වරට මෙම විශේෂයට අයත් පොසිල ගවේෂණය සිදු කරන ලදී. ඒවා සොයා ගන්නා ලද්දේද ඉතියෝපියාවේ මධ්‍යම අවාශ් ප්‍රදේශයෙනි. ආඩිපිතකස් රැමිඩස් විශේෂයට අයත් 45 දෙනකුට පමණ අයත් පොසිල කොටස් 100කට අධික සංඛ්‍යාවක් මේ වන විට සොයාගෙන ඇත. ඉන් වැඩි ප්‍රමාණයක් දත් වේ. පසුකාලීනව උතුරු ඉතියෝපියාවේ ඩූමා ප්‍රදේශයෙන්ද පොසිල කොටස් සොයාගෙන ඇති අතර, ඉතියෝපියාවේ සහ උතුරු කෙන්යාවේ තවත් ප්‍රදේශ කිහිපයකින් සොයාගෙන ඇති පොසිල සමහරක්ද මෙම විශේෂයට අයත් යැයි සැක කෙරේ.

අෆාර් භාෂාවෙන් 'මූලය' යන අරුත් ඇති 'රැමිඩ්' යන වචනය මෙම විශේෂය නම් කිරීමේදී යොදාගෙන ඇත. දැනට සොයාගෙන ඇති සාක්ෂි අනුව රැමිඩස් අදින් වසර මිලියන 4.4ත් 4.2ත් අතර කාලයේ මිහිමත වාසය කර ඇත. මානව පරිණාමය තුළ මෙම කාලයට අයත් ලෙස සැලැකෙන මෙතෙක් සොයාගෙන ඇති එකම විශේෂය ආඩිපිතකස් රැමිඩස් වීම විශේෂත්වයකි.

රැමිඩස්ට පා සතරෙන් පහසුවෙන් ගස් මත ඇවිද යාමේ හැකියාව තිබූ අතර, විශේෂ අවස්ථාවල, විශේෂයෙන් ගසින් බිමට බැස සිටින අවස්ථාවල දෙපයින් සිට ගැනීම සහ දෙපයින් ගමන් කිරීම සිදුකරන්නට හැකියාව තිබී ඇති බව විද්‍යාඥයෝ පවසති. ඔවුන්ගේ කපාල ධාරිතාව ඝන සෙන්ටිමීටර් 300 - 350ක් පමණවූ අතර, එය වත්මන් චිම්පන්සීන්ට සමාන අගයකි.

07 කලාපය

ජාත්‍යන්තර තොරතුරු GLOBAL NEWS

# උතුරු කොරියාවේ කම්කරු පක්ෂයේ නමවන සමුළුව සාර්ථකව අවසන්



පසුගිය පෙබරවාරි 19 දින උතුරු කොරියාවේ කම්කරු පක්ෂයේ නමවෙනි සමුළුව පවත්වන ලදී. නියෝජිතයන් 5000න් සමන්විත වූ සමුළුව තුළ උතුරු කොරියාවට අදාළව අවුරුදු පහකට පෙර පැවැති අටවෙනි සමුළුවට පසුව රටේ කාර්මික සංවර්ධනය සහ ජනතාවගේ ජීවන තත්ත්වයන්ගෙ වර්ධනය ආදිය සමාලෝචනය කර ගන්නා ලදී. ඒ අනුව ආර්ථික සංවර්ධනය පක්ෂ ප්‍රතිපත්තීන් සංවර්ධනය ආදිය සඳහා නව යෝජනාවලියක් සම්මත කරගන්නා ලද අතර මීළඟ අවුරුදු පහ සඳහා පක්ෂ ප්‍රධාන ලේකම් සහ පක්ෂ මධ්‍යම කාරක සභාවද පත්කර ගන්නා ලදි.

# ආජන්ටිනාවේ අන්ත දක්ෂිණාංශික ජනාධිපති හාවියර් මිලේට එරෙහිව කම්කරුවෝ නැවතත් වීදි බසිති



හාවියර් මිලගේ අන්ත දක්ෂිණාංශික ආණ්ඩුව 2023 දී බලයට පැමිණීමත් සමඟ සිව්වන වතාවටත් ඇති වූ දැවැන්ත පරිමාණයේ වැඩවර්ජනය රැල්ල මේ වන විට ආජන්ටිනාව පුරා හමා යමින් ඇත. මෙවර වැඩවර්ජනයට හේතු වී ඇත්තේ හාවියර් මිලේගේ ආණ්ඩුව විසින් ගෙන එන ලද කම්කරු පනතක් සම්බන්ධයෙනි. මෙම පනතට පාර්ලිමේන්තුව තුළ 125ක් පක්ෂව ඡන්දය ලබා දුන් අතර 115 විරුද්ධව ඡන්දය ලබා දෙන ලදී. නව පනතට අනුව වැඩ දිනය පැය 8 සිට 12 දක්වා ඉහළ දමා ඇත. එසේම වැඩ වර්ජන කිරීමේ අයිතීන්ද කප්පාදු කර ඇති අතර අසනීප නොවන විටදී ඇති වරප්‍රසාද ද මින් කප්පාදු කොට ඇත. 2023දී අන්ත දක්ෂිණාංශික මිලේගේ ආණ්ඩුව පත්වීමෙන් පසුව දෛනිකව 400කගේ පමණ රැකියාවන් අහිමිවන අතර දැඩි දක්ෂිණාංශික අදහස් මත ක්‍රියාත්මක වන ආණ්ඩුව රැකියා කප්පාදු කිරීම, IMF කොන්දේසි සඳහා පූර්ණ ලෙස එකඟවීම් සහ ආජන්ටිනානු ධනපතින්ගේ වුවමනාන් සඳහා දැඩි එකඟතාවයන් පවත්වාගෙන යාමෙන් පවත්වාගෙන යන පාලනය සම්බන්ධයෙන් ආජන්ටිනාව තුල දැඩි විරෝධයකට ලක්ව ඇත.

# නේපාලයට නව පාලනයක්




පසුගිය සැප්තැම්බර් මාසයේ දී නේපාලය තුළ ඇති වූ ගැටුම්කාරී තත්ත්වයන් සමඟ කේ.පී ශර්මා ඔලිගේ නායකත්වයෙන් යුතු කොමියුනිස්ට් පක්ෂයේ සන්ධාන ආණ්ඩුවට ඉල්ලා අස්වීමට සිදුවිය. නේපාලය තුළ ඥාති සංග්‍රහය, තරුණ රැකියා වියුක්තිය, වංචා දූෂණ ආදිය නිසා ඇතිව තිබූ ව්‍යාකුල තත්ත්වය සමාජ මාධ්‍ය හරහා ප්‍රකාශ වෙමින් පැවතිය. සැප්තැම්බර් මුල පනවන ලද සමාජ මාධ්‍ය තහනමත් සමඟ මෙම මහජන අසහනය පුපුරා යන ලදී. ඇති වූ ගැටුම්කාරී තත්ත්වයන් කළමනාකාරී කිරීමට නොහැකි වීමත් සමඟින් සැප්තැම්බර් 9වන දින ශර්මා ඔලි හට ඉල්ලා අස්වීමට සිදුවිය. පැවැති අන්තර්කාලීන පාලනය මාර්තු 5 දින මහ මැතිවරණය පැවැත්වීමට තීරණය කරන ලදී.

ඒ අනුව පවත්වන ලද මහ මැතිවරණයට තරග කරන ලද නව බලවේගයක් වන බාලෙන් ශාහ්ගේ නායකත්වයෙන් යුතු රාශ්ඨීය ස්වතන්ත්‍ර පක්ෂය දැවැන්ත ජයග්‍රහණයක් ලබා ගන්නා ලදී. ඒ අනුව බාලෙන් ශාහ් ඉදිරියේදී නේපාලයේ නව අගමැති ලෙස පත්වීමට නියමිතය. බාලෙන් ශාහ් පසුගිය සමයේ රැපර් ගායකයෙකු මහජනතාව අතර ප්‍රචලිත 2022දී කත්මන්ඩු අග නගරයේ නගරාධිපති ධූරයට පත් වූ අතර දීර්ඝ ඉතිහාසයක් නොමැති නව බලවේගයක් වන රාශ්ඨීය ස්වතන්ත්‍ර පක්ෂයේ දේශපාලන ක්‍රියාකාරිත්වය කුමන ආකාරයක් ගනු ඇත්දැයි බොහෝ පාර්ශවවල අවධානයට ලක්ව ඇත.

## 2025 වසරේ ආර්ථිකය ....

01 - පිටුවෙන්

එනිසාම මුදල් අච්චු ගැසීම වැනි උද්ධමනයට සෘජුවම තුඩුදෙන ක්‍රියාමාර්ග ගැනීමට රජයට අවශ්‍ය වූයේ නැත. මේ අතර, නිල විදේශ සංචිත ප්‍රමාණයද 2025 වසරේ ඩොලර් මිලියන 6,800ක් දක්වා ඉහළ ගොස් තිබිණි. පසුගිය කාලයේ සිදුවූ ආර්ථික අර්බුදයට ප්‍රධාන හේතුවක් වූයේ විදේශ විනිමය නොමැති නිසා මෙම විදේශ සංචිත අනුපාතය පහළ මට්ටමක පැවැතීමයි. ප්‍රමාණවත් විදේශ සංචිත නොමැතිවීම අත්‍යවශ්‍ය ආනයන භාණ්ඩ මෙරට තුළට ගෙන්වා ගැනීම අපහසු කරවන අතර, ණය වාරික සහ පොලී ගෙවීමට මුදල් නොමැති වීමෙන් ණය ගෙවීම පැහැර හැරීමටද මෙවැනි කරුණු බලපායි.

| | 2025 | 2026 |
|---|---|---|
| අයවැය හිඟය (රු. බිලියන) | 2,040 | 774 |
| | 6.8 | 2.4 |
| (වගු අංක 04) | | |

කෙසේ වෙතත් ඉහත සඳහන් කළ දත්ත කිහිපයක් පමණක් සලකා බැලුවද ලංකාවේ ආර්ථිකය ඉතා කෙටි කාලයකින් ස්ථාවරභාවයට ළඟා වී ඇති බවක් පෙනේ.

## වානරයාගේ සිට මිනිසා දක්වා ....

04-05 - පිටුවෙන්

ශරීර විශාලත්වය වර්තමාන චිම්පන්සීන්ට ආසන්න වශයෙන් සමාන වන අතර, සාමාන්‍ය උස සෙන්ටි මීටර 120ක් පමණ වන්නට ඇතැයි සැලැකේ. වානරයන් මෙන්ම මුල්කාලීන මානව විශේෂ තුළද පිරිමි සහ ගැහැනු විශේෂ අතර ශරීර විශාලත්වය තුළ පැහැදිලි වෙනසක් පිළිබිඹු වුවද, ආඩිපිතකස් රැමිඩස් ඊට වෙනස්වීම විශේෂත්වයකි. ඔවුන්ගේ පිරිමින් සහ ගැහැනුන් අතර ශරීර විශාලත්වය වෙනස්ව ඇත්තේ ඉතා මඳ වශයෙනි.

සුළු වෙනස්කම් හැරුණුවිට රැමිඩස් බොහෝ දුරට අපි වර්තමානයේ දකින වානරයන්ට රූපයෙන් සමාන විය. ඔවුනට දිගු අත් තිබුණද, ඒවා වත්මන් මිනිසුන් මෙන් බර ඔසවාගෙන යාමට භාවිත කළ බවක් නොපෙනේ. එමෙන්ම එම දෑත් වත්මන් වානරයන් මෙන් මිට මොළවා ඇවිදීම සඳහා යොදා ගත් බවක් ද දක්නට නැත. ඇඟිලිවල අස්ථි දිගුව සහ වක්‍රව පිහිටා ඇත්තේ ගස් මත ගමන් කිරීමේදී පහසුවෙන් අල්වාගත හැකි වන පරිදිය. එහෙත්, දෙපයින් ඇවිදීමේ හැකියාව පවතින මට්ටමට දෙපා අස්ථි හැඩගැසී ඇත. නමුත්, බොහෝ දුරක් දෙපයින් ඇවිද යාමට හෝ දිව යාමට සුදුසු මට්ටමට ඒවා හැඩගැසී නොතිබිණි.

වානරයන් හා සමානව විශාල රදනක සහ චාර්වක දත් රැමිඩස් සතු විය. එහෙත්, රදනක දත්වල විශාලත්වය චිම්පන්සීන්ට සාපේක්ෂව කුඩාය. ඒවා ඔරෝරින්ගේ රදනක දත්වලට බොහෝ සෙයින් සමානය. දත්වල එනැමලය චිම්පන්සීන් සහ ඔස්ත්‍රෙලෝපිතකස් අතරමැද මට්ටමක ඇත. කුඩා මුහුණක් සහ චිම්පන්සීන්ට සාපේක්ෂව සිරස් හිසක් රැමිඩස්ට තිබී ඇත.

ආඩිපිතකස් කඩබ්බා මෙන්ම ආඩිපිතකස් රැමිඩස්ද ආයුධ ලෙස ගල් කැබැලි සහ ලී දඬු භාවිත කර තිබුණද, ඒවා ආහාර සකසා ගැනීම වැනි සරල කටයුතු සඳහා පමණක් සීමා විය. එමෙන්ම ඔවුන් ආයුධ සකස් කර ගැනීමට උත්සාහ කර නැති අතර, වටාපිටාවෙන් සොයාගත හැකි ඒවා භාවිත කර ඇත.

රැමිඩස් ජීවත්ව සිට ඇත්තේ, තෘණ භූමිවලට වඩා වනාන්තර තුළයි. ඔවුන්ගේ සාමාන්‍ය ජීවිතයේ වැඩි වේලාවක් ගස් මත සිටීමට ප්‍රිය කිරීම ඊට හේතු වන්නට ඇත. ශාක පත්‍ර, පලතුරු වර්ග, ඇට වර්ග මෙන්ම කෘමි සතුන් සහ කුඩා ක්ෂීරපායීන් සිය ආහාර ලෙස රැමිඩස් භාවිත කරන්නට ඇතැයි විශ්වාස කෙරේ. ඒ අතුරින් වැඩි වශයෙන් භාවිත කර ඇත්තේ ශාක පත්‍ර බව ද පරීක්ෂණ වලදී තහවුරු වී ඇත.

ආඩිපිතකස් කඩබ්බා පරිණාමය වීමෙන් බිහිවූ ආඩිපිතකස් රැමිඩස් වසර ලක්ෂ ගණනක් මිහිමත වාසය කිරීම තුළ ක්‍රමයෙන් ඔස්ත්‍රෙලෝපිතකස් විශේෂ බවට පත් වන්නට ඇති බවත් විද්‍යාඥයෝ විශ්වාස කරති.

## කාල් මාක්ස්......

08 - පිටුවෙන්

✦ **අතිරික්ත වටිනාකම් පිළිබඳ නියාමය හෙළි කිරීම:**

ආර්ථික විද්‍යාවේ දී මාක්ස් සිදු කළ විශිෂ්ට සොයා ගැනීම වන්නේ අතිරික්ත වටිනාකම පිළිබඳ නියමය සොයා ගැනීමය. එමඟින් ධනේශ්වර සූරාකෑම අනාවරණය කළ අතර, ධනවාදය තුළ නිෂ්පාදනයේදී ලාභය යනු ශ්‍රමිකයාට නොගෙවන ලද කොටස් බව තහවුරු කෙරිණි.

ඇඩම්ස් ස්මිත්, ඩේවිඩ් රිකාර්ඩෝ වැනි ධනේශ්වර නිල ආර්ථික විද්‍යාඥයන්ගේ වැරැදි මත බිඳීමට මෙමඟින් මාක්ස්ට හැකි විය.

මෙසේ 1867දී පළ කිරීම ඇරැඹූ 'ප්‍රාග ධනය' කෘතිය තුළත් මාක්ස් මෙම නියාමය මනාව තහවුරු කළේය. එමඟින් ධනේශ්වර සූරාකෑමේ යාන්ත්‍රණය හෙළි කළේය.

- මාක්ස්ගේ අතිරික්ත න්‍යායෙහි මුල් ගල, අතිරික්ත වටිනාකම් පිළිබඳ න්‍යායය." - ලෙනින් - 1 වැනි වෙළුම, 50 වැනි පිටුව.

අත්‍යර්ථ ප්‍රාග්ධනය පිළිබඳ සංකල්පයද මාක්ස් විසින් හෙළිදරවු කරන ලද අතර, වර්තමානයේ ධනවාදී ප්‍රාග්ධනය තුළ අර්බුදයක් බවට පත්වූ සංකල්පයකි.

✦ **ධනවාදය තුළ මතු වන විවිධ අර්බුද පිළිබඳවද අවධානය යොමු කළ මාක්ස් ඒවා ගැන ලිවීය:**

✧ ධනවාදය තුළ සිදුවිය හැකි පරිසර විනාශය පිළිබඳව මාක්ස් අවධානය යොමු කළේය. 1844දී පළවූ 'ආර්ථික හා දාර්ශනික අත්පිටපත්' නමැති ලියැවිල්ලේ මෙසේ සඳහන් විය: **"මිනිසාගේ ජීවය ඇත්තේ, සොබාදහම තුළය. එනම්, සොබාදහම යනු මිනිසාගේ ශරීරයයි. එනම්, නොමැරී සිටීමට නම්, ඔහු සොබාදහම සමඟ අඛණ්ඩ ගනුදෙනුවක් පවත්වාගත යුතුය. මිනිසාගේ භෞතික හා ආධ්‍යාත්මික ජීවිතය සොබාදහම සමඟ සම්බන්ධවී ඇතැයි යන්නේ අර්ථය නම්, සොබාදහම එය සමඟම සම්බන්ධවී ඇතැයි යන්නය. මන්ද යත්, මිනිසා යනු සොබාදහමේම කොටසක් බැවිනි."**

සොබාදහමේ පැවැත්ම නොසලකා එය කොල්ලකාරී ලෙස විනාශ කරන ආත්මාර්ථකාමී ධනේශ්වර දෘෂ්ටිය මෙන්ම මිනිසාගේ පැවැත්ම නොසලකා සොබාදහම පමණක් ආරක්ෂා කිරීමට කතා කරන ඊනියා පරිසරවේදීන්ගේ දැක්මද මාක්ස් මෙහිදී ප්‍රතික්ෂේප කරමින්, සොබාදහම සහ මිනිසා අතර ඇති පැවැත්මේ දයලෙක්තිකය පෙන්වා දී තිබේ.

✦ **පරත්වාරෝපණය හෙළි කිරීම:**

ධනවාදී නිෂ්පාදනය තුළ මිනිසා නිෂ්පාදනයට දායකවීමෙන් ලබන තෘප්තිය නොලැබීම නිසා ඔහු නිෂ්පාදනයෙන් පිටස්තරයකු වන බව පැහැදිලි කළේ මාක්ස්ය.

# කාල් මාක්ස්
# නිමා නොවන ගුණානුස්මරණ

**කාල් මාක්ස්ගේ ප්‍රාණය නිරුද්ධවී පසුගිය 14 වැනි දිනට වසර 143ක් විය. බොහෝ දාර්ශනිකයන් ඉන් පෙර විසූවන්ට වඩා ඉදිරිගාමී දර්ශනවාද ඉදිරිපත් කළ පසුත් ඔවුන්ගේ ඓතිහාසික කාර්යභාරය අගය කරනු විනා එකී දර්ශන මතු මතුත් ලෝකයේ භාවිතාවට අදාළ නොවේ. එහෙත්, මාක්ස්ගේ දර්ශනය ඔහුගේ ජීවිතාවසානයෙන් වසර 150කට ආසන්න වීත්, ලෝක නිර්ධන පන්ති ව්‍යාපාරයට මඟ කියන පහන් තරුවක් ලෙසින් ඉහළින් දිස් වේ. එනිසාම පසුගිය සහශ්‍රයේ ලොව හොඳම දාර්ශනිකයා වූයේ කාල් මාක්ස්ය.**

✦ මාක්ස්වාදී දර්ශනයේ හරය ලෙස සැලැකිය හැකි මාක්ස් හෙළි කළ සොයාගැනීම්:

✧ ඉතිහාසය පිළිබඳ විඥ්ඥාණවාදී දැක්ම වෙනුවට ඉතිහාසය පිළිබඳ ද්‍රව්‍යවාදී පදනම හෙළි කිරීම සහ දයලෙක්තික භෞතිකවාදය ඉදිරිපත් කිරීම.

ඉතිහාසය නිර්මාණය කරන්නේ දෙවියන්, රජවරුන් හෝ වීරවරයන් නොව වැඩ කරන ජනතාව (මිනිසුන්) බවයි.

"මිනිස්සු ස්වකීය ඉතිහාසය නිර්මාණය කරති. එහෙත්, ඔවුන් එසේ කරන්නේ ඔවුන්ට රිසි පරිදි නොවේ. ඔවුන් විසින් තෝරා ගනු ලැබූ තත්ත්වයන් යටතේ ඔවුහු එය නිර්මාණය නොකරති. ඔවුන් ඉදිරියේ පවතින, ඔවුන්ට ලැබී ඇති සහ අතීතයෙන් සංක්‍රමණයවූ තත්ත්වයන් යටතේය, ඔවුන් නිර්මාණය කරන්නේ."

-මාක්ස් - 1 වැනි වෙළුම, 128 වැනි පිටුව

සමාජය සංවර්ධනය වන බවත්, එහි පදනම පුද්ගල කැමැත්ත නොව නිෂ්පාදන ක්‍රියාවලිය බවත්, සමාජ සංවර්ධනයේ දයලෙක්තිකය නිෂ්පාදන බලවේග සහ නිෂ්පාදන සම්බන්ධතා අතර පවතින බවත් පැහැදිලි කොට සමාජ සංවර්ධනයේ අනුරූපිතා නියාමය පැහැදිලි කිරීම.

මෙහිදී සමාජ විඥානය විසින් සමාජ සත්තාව තීරණය නොකරනු ලබන බවත්, ඒ වෙනුවට සමාජ සත්තාව (ද්‍රව්‍යමය ජීවිතය) විසින් සමාජ විඥනය තීරණය කරන බවත් හෙළි කිරීම.

"මිනිස්සු ඔවුන්ගේ ජීවිතයේ සමාජ නිෂ්පාදන කටයුතුවලදී නිශ්චිත සම්බන්ධකම්වලට එළැඹෙති. ඒවා නොමැතිව බැරි සහ ඔවුන්ගේ කැමැත්තෙන් ස්වාධීනවූ සම්බන්ධකම්ය. ඒවා ඔවුන්ගේ ද්‍රව්‍යමය නිෂ්පාදනීය බලවේගයෙන්ගේ නිශ්චිත සංවර්ධන අවධියකට අනුරූප වන නිෂ්පාදන සබඳකම්ය.

"මෙම නිෂ්පාදන සබඳකම්වල එකතු සමස්තයෙන් සමාජයේ ආර්ථික ව්‍යුහය සමන්විත වේ. නෛතික හා දේශපාලන උඩුව්‍යුහය ඉදිවන්නේ එම ආර්ථික ව්‍යුහය නමැති තථ්‍ය අඩිතාලම මතය. සමාජ විඥානයේ නිශ්චිත ආකාරද එයටම අනුරූප වේ. ද්‍රව්‍යමය ජීවිතයේ නිෂ්පාදන ක්‍රමය විසින් සමාජමය, දේශපාලනමය සහ චෛතසික ජීවිතයේ ක්‍රියාදාමයන් පොදු වශයෙන් හැඩගස්වනු ලැබේ. මිනිසුන්ගේ සත්තාව නිර්ණය කෙරෙන්නේ ඔවුන්ගේ විඥානය විසින් නොවේ. ඊට ප්‍රතිකූල වශයෙන් ඔවුන්ගේ විඥානය නිර්ණය කෙරෙන්නේ ඔවුන්ගේ සමාජ සත්තාව විසිනි. සමාජයේ නිෂ්පාදනීය බලවේගයන්ගේ කිසියම් සංවර්ධන අවධියකදී ඒවා පවතින නිෂ්පාදන සබඳතාවන් සමඟ නැතහොත්, (එයම විස්තර කෙරෙන නෛතික කියමනක්සේ පමණක් ගත හැකි) ස්වකීය ක්‍රියාකාරීත්වයේදී ඒවා තුළ මෙතෙක් පැවැති දේපොළ සම්බන්ධකම් සමඟ සංඝට්ටනය වෙයි. නිෂ්පාදනීය බලවේගයන්ගේ සංවර්ධන ආකෘතියේ පටන් ගැනුණු මෙම සම්බන්ධකම් ඒවායේ විලංගු බවට පත් වෙයි. ඒවාට සමාජ විප්ලවයේ යුගයක් ඇරැඹෙන්නේය."


-මාක්ස් - දේශපාලන අර්ථ ශාස්ත්‍රය පිළිබඳ විවේචනය ගැන.

✦ නිර්ධන පන්ති රාජ්‍ය බලය පිළිගැනීම:

මාක්ස් සමාජය තුළ පන්ති සටන පිළිගත්තේය. එහෙත්, ඔහුගේ විශේෂත්වය වූයේ පන්ති සටන පිළිගැනීම නොව නිර්ධන පන්ති රාජ්‍ය බලය පිළිගැනීමය.

පන්ති සටන පිළිගැනීම සහ වටහා ගැනීම මාක්ස්වාදයේ ප්‍රධානතම කරුණ වේ. එය නොපිළිගෙන මාක්ස්වාදියකු වීමට හෝ ලෝකය තේරුම් ගැනීමට හෝ නොහැකිය. ඒ පිළිබඳව පිදෙල් මෙසේ පවසයි:

"සමාජය කුමක්දැයි මාක්ස්වාදය මට ඉගැන්නුවා. මම ඊට පෙර සිටියේ, දෑස් බැඳ උතුර - දකුණ සොයා ගැනීමට නොහැකිව මහා වනයක අතරමංවූ අයකු ලෙසයි. ඔබ සැබෑ ලෙසම පන්ති අරගලයේ ඉතිහාසය තේරුම් ගත්තේ නැත්නම්, අඩු ගණනේ සමාජය පොහොසත් සහ දුප්පත් ලෙස බෙදී ඇති බව හා එක් පිරිසක් අනෙක් පිරිස සූරාකන බව පැහැදිලිව තේරුම් ගත්තේ නැත්නම්, ඔබ කැලෑවක අතරමංවූ කිසිවක් නොදන්නා අයකු බවට පත් වෙනවා."



-පිදෙල් - 'මගේ ජීවිතය' පොතෙන්.

('කොමියුනිස්ට් ප්‍රකාශනයේ' පළමු වාක්‍යය ලෙස මාක්ස් සහ එංගල්ස් ලියුවේද මෙයය.)

එහෙත්, මාක්ස්ගේ විශේෂත්වය ඔහු පන්ති සටන පිළිගැනීමෙන් නතර නොවී නිර්ධන පන්ති රාජ්‍ය බලය පිළිගැනීම බව ලෙනින් මෙසේ පවසයි:

"මාක්ස්ගේ න්‍යායෙහි ප්‍රධාන කරුණ 'පන්ති අරගලය' යැයි බොහෝ විට කියනු ලැබේ; ලියනු ලැබේ. නමුත්, එය වැරැදිය. එම පමණක් නොව මෙම වැරැදි මතයෙහි ප්‍රතිඵලයක් වශයෙන් මාක්ස්වාදය බෙහෝ විට අවස්ථාවාදී ලෙස වෙනස් කිරීමට සහ එය ධනපති පන්තියට පිළිගත හැකි ආකාරයට විකෘති කිරීමටද හේතු වන්නේය. එසේ වන්නේ පන්ති අරගලය පිළිබඳ න්‍යාය මාක්ස් විසින් නොව ඔහුට පෙර නිර්මාණය කරන ලද හා සාමාන්‍යයෙන් කිවහොත්, එය ධනපති පන්තියට පිළිගත හැකි හෙයිනි. පන්ති අරගලය පමණක් පිළිගන්නා අය එතෙකින් මාක්ස්වාදීන් නොවෙති. ඔවුන් තවමත් ධනපති චින්තනයේ සහ ධනපති දේශපාලනයේ සීමාවන් තුළ සිටිනු දක්නට ලැබේ. මාක්ස්වාදය පන්ති අරගලයේ න්‍යායට පමණක් සීමා කිරීම යනු, මාක්ස්වාදය කප්පාදු කිරීමක්, එය විකෘති කිරීමක් සහ එය ධනපති පන්තියට පිළිගත හැකි වන යමක් දක්වා බාල කිරීමක් වන්නේය. මාක්ස්වාදියකු වන්නේ පන්ති අරගලය පිළිබඳ පිළිගැනීම නිර්ධන පන්ති ආඥාදායකත්වය පිළිගැනීම දක්වා ව්‍යාප්ත කරන තැනැත්තකු පමණකි."

-ලෙනින් - තෝරා ගත් කෘති, 6 වැනි වෙළුම, 40 වැනි පිටුව 40 වැනි පිටුව.)

07 පිටුව